| | |
|---|---|
| පාඨමාලාව | PALI 3101.03 – පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය |
| දේශක | මැදගම්පිටියේ විජිතධම්ම හිමි |
| දේශනය | අංක 01 |
| මාතෘකාව | **ඉන්දු ආර්ය ව්‍යාකරණයේ ප්‍රාරම්භක ලක්‍ෂණ** |
| අරමුණ | ඉන්දු ආර්ය භාෂාවක් වන වෛදික/සංස්කෘතය තුළ ව්‍යාකරණය බිහි වූ ආකාරය පරීක්‍ෂා කිරීම |
| **අපේක්‍ෂිත ඉගෙනුම් ඵලය** | මෙම දේශනය අවසානයේ දී වෛදික හා සංස්කෘත භාෂා ආශ්‍රයෙන් ක්‍රමානුකූලව ව්‍යාකරණය බිහි වූ ආකාරය විස්තර කිරීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත. |

## ඉන්දු ආර්ය ව්‍යාකරණයේ ප්‍රාරම්භක ලක්‍ෂණ

පෙරදිග බිහි වී අද අප හමුවේ ඇති පැරණිතම සාහිත්‍ය සාධකය වන වෛදික සාහිත්‍යය මුල් කරගෙන පෙරදිග ව්‍යාකරණයේ ප්‍රභවය සිදු විය. වාග්වේදීන්ට අනුව වේද සාහිත්‍යය අයත් වන්නේ පුරාතන ඉන්දු ආර්ය භාෂා යුගයට ය. ඍග් වේදයේ ඇති වෛදික භාෂාව ඉන්දු ආර්ය යුගයේ පැරණිතම අවස්ථාව නියෝජනය කරයි. ඉන්දු ආර්ය භාෂාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ඉන්දියාවෙන් පිටතට ගමන් කර ඉන්දු යුරෝපීය භාෂා පවුල හා සම්බන්ධ වේ. මෙහි ලා ඒ පිළිබඳ විමර්ශනයකට අවකාශ නැත.

### පද වෙන් කිරීම මූලික කරගත් වාක්‍ය විභාගය

ආර්යාගමනයේ සිට මුල්ම වේද සම්පාදනය වූ අවධිය තෙක් ආදි ආර්ය භාෂාවෙහි ශබ්දවිද්‍යාව අතින් බොහෝ වෙනස්කම් සිදු වී ඇත.[1] එහෙත් වෛදිකයන් විසින් වේද මන්ත්‍ර සම්පාදනය කරන ලදුව එමගින් පිළිගත් ශාස්ත්‍රීය භාෂාවක් සකස් කරනු ලැබ ඊට අනුගත වූ අධ්‍යයන සම්ප්‍රදායක් ද බිහි කරන ලදී. ඒ නිසාම වෛදික සාහිත්‍යය හා තදනුගත ආගමික හා සමාජ සංස්ථාව සිය උරුමය කරගෙන එහි භාරකාරත්වය ද තමන් වෙත පවරාගත් බමුණු ආචාර්යවරු ඒවා රැක ගැනීමට මහත් උත්සාහයක් දැරූහ. ඔවුන්ගේ වෑයම කෙබඳු වුව ද ඉන්දියාවේ ප්‍රාග් අවෛදික ඇදහිලි ක්‍රම හා භාෂා ලක්‍ෂණ වෛදික ආගමට හා භාෂාවට කෙමෙන් ප්‍රවේශ වන්නට විය. ක්‍රමයෙන් සිදු වූ වෛදික අවෛදික සම්මිශ්‍රණය නිසා ආගමෙහි පමණක් නොව භාෂාවේ ද වෙනස් ලක්‍ෂණ ඇතිවීමට මග පෑදුනේය. පැරණි ඉන්දු ආර්ය භාෂාවේ ඇතැම් මූර්ධන්‍ය ශබ්ද හැඩ ගැසීමට අනාර්ය භාෂාවලින් ඇති වූ බලපෑම ඊට නිදසුනකි. ඒ නිසා එබඳු ආගන්තුක බලපෑම් පිළිබඳ දැඩි අවධානයකින් යඥ ආදි ආගමික කාර්යවල දී ස්වර, වර්ණ හා පද ආදියෙන් වෛදික භාෂාව නිවැරදිව ව්‍යවහාර කිරීමට බමුණු ඇදුරන්ට සිදු විය. ඒ සඳහා ශික්‍ෂා නමින් වෙන ම ගුරුකුලයක් බිහිවිය.[2] හැකිවීම යන අර්ථ ඇති ශක් ධාතුවෙන් නිපන් ඉච්ඡාර්ථක නාමය වන ශික්‍ෂා යන නාමයෙන් හැකියාව ලැබීමේ කැමැත්ත යන අදහස ලැබේ. විශේෂයෙන් මෙයින් අදහස් කරන ලද්දේ පඨනයෙහි හැකියාව යි. සංහිතාවන්ගේ නියම උච්චාරණය, ස්වරණය ආදිය ඉගෙනීම එයින් අදහස් විය. සංහිතා පාඨ හා පද පාඨ සකස් කිරීම ශික්‍ෂා ශාඛාවෙහි ආචාර්යවරුන්ගෙන් සිදු වූ ආරම්භක ක්‍රියාවන් ය. එක් පදයක අන්තය අනිත් පදයේ ආදිය හා සන්ධි

---

[1] T. Burrow, The Snaskrit Language, London, 1954, p. 33

[2] ජිනසෝම වීරසූරිය, සංස්කෘත කෝෂ සාහිත්‍යය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 1991, පි. 12

කොට එක් කරලන ගමන් ම අතරක් නොතබා දිවෙන හෙයින් වේද පාඨ සංහිතා නමින් හඳුන්වනු ලැබේ. සංහිතා පාඨයට වස්තු වී ඇත්තේ වෙන් වෙන් වූ පදයන් ය. වෛදිකයන්ගේ මුවින් නැගුණු වෙන් වෙන් වූ පද උක්ත ක්‍රමයෙන් සංහිතා ලෙසින් සකසන ලද්දේ මෙම ශික්‍ෂා ආචාර්යවරුන් විසිනි. සංහිතාවන්හි මන්ත්‍ර දක්නට ඇත්තේ පුරාතන ඍෂීන් විසින් ඒවා රචනා කරන ලද ස්වරූපයෙන් ම නොවන බව ඒවායේ ඡන්දස් ලක්‍ෂණ අනුව සනාථ කළ හැකිය. සංහිතකරුවෝ මන්ත්‍රවල සන්දර්භය වෙනස් නොකළහ. එහෙත් එවකට භාවිත වූ යම් යම් සන්ධිවිධි යොදා ඒවා සකස් කළහ. ඒ අනුව ඇතැම්විට මන්ත්‍රවල ස්වර ප්‍රශ්ලිෂ්ට විය. නැතහොත් අන්තඃස්ථවලට පෙරළනු ලැබිණ. එසේම එකාර ඔකාරයන්ගෙන් පරවූ අකාරය ලොප් විය. එවිට සංහිතාවන්ගේ වෘත්තය පවා සැඟවී ගියේය. නිදසුන් ලෙස සංහිතා පාඨයෙහි ඇති 'ත්වම් හ්‍යග්නෙ' යන්න දැක්විය හැකිය. එය පුරාතන ඍෂීන් විසින් 'තුවං හි අග්නෙ' යනුවෙන් පඨනය කළ බව ඡන්දස් අනුව පැහැදිලි කරගත හැකිවේ. තුවං යන්නෙහි ආදි ස්වරය ලොප් කොට ත්වම් ලෙසත් හි යන්නෙහි ස්වර ලෝපයෙන් පසු ඉතිරිවන හ් කාරය අපර ස්වරයට එක් කිරීමෙන් හ්‍යග්නෙ ලෙසත් නව පද දෙකක් ශික්‍ෂාකරුවෝ සැකසූහ. මෙවන් අවස්ථාවල දී ශික්‍ෂාකරුවන් අනුගමනය කළ සන්ධි කිරීමේ නීති ආදියෙන් ඔවුන් සතුව තිබූ ව්‍යාකරණ ඥානය ද ප්‍රකට වේ.

අනෙක් අතට ලිවීමේ කලාව දියුණු නොවී පැවතුණු පුරාතන ඉන්දු ආර්ය යුගයේ දී වෛදික ධර්මය හා ඊට අයත් ඇදහීම් ක්‍රම පිළිබඳ චිරස්ථිතිය රඳා පැවතුනේ වනපොත්කරණය මත ය. එම නිසා වෛදික කෘතීන්ට අයත් සෑම වචනයක් අකුරක් මාත්‍රාවක් හෝ වෙනසකට පත්විය නොදී සුරක්‍ෂිත කිරීම අවශ්‍ය විය.[3] මුඛ පරම්පරාවෙන් සාහිත්‍යයක් ඉදිරියට ගෙනයෑමේ දී ඉතා කුඩා වරදක් හෝ නිවැරදි කර ගැනීමට අවස්ථාවක් නොලැබෙන නිසා බ්‍රාහ්මණ පූජකවරු තම ඉගැන්වීම්වල උච්චාරණ ශුද්ධිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළහ.

වෛදික භාෂාව ජනතාව අතර ව්‍යවහාර භාෂාවක් ලෙස පැවති කාලය තුළ ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමුකරන්නට සිදු නොවූවද ව්‍යවහාරයෙන් දුරස්වෙමින් ආගමිකත්වයට පමණක් සීමාවන්නට පටන් ගැනීමෙන් පසු එය උගන්වන හා ඉගෙනගන්නා දෙපිරිසේ ම පහසුව පිණිස භාෂාව භාවිත කළ යුතු විධිය පිළිබඳ නීති-රීති මාලාවක් සැකසීමට සිදුවිය. එහි දී සිදුකරන ලද්දේ වෛදික සූක්තවලට අයත් ශ්ලෝකපාද විග්‍රහ කොට වචන වෙන් කිරීම, සන්ධි හා සමාස විග්‍රහ කිරීම, වචන වර්ණවලට බෙදීම, එක් එක් ශබ්දය පැහැදිලි ලෙස උච්චාරණය කිරීම, හ්‍රස්ව-දීර්ඝ, උදාත්ත-අනුදාත්ත-ස්වරිත ආදි භේද හඳුනාගැනීම වැනි භාෂා රීති රාශියක් ඊට ඇතුළත් විය. ස්වකීය ආගමික සාහිත්‍යයේ පරිශුද්ධතාවත් චිරස්ථිතියත් අරමුණු කරගෙන බ්‍රාහ්මණයන් විසින් සැකසූ වාග් රීති මාලාව ව්‍යාකරණයේ ආරම්භය සේ සැලකිය හැකිය.

භාෂාව වෛදික ඍෂිවරුන්ගේ විශේෂ සැලකිල්ලට භාජනය වූ අතර භාෂා විග්‍රහය සංහිතා යුගයේ දී ම ආරම්භ වී යැයි සැලකිය හැකිය. අක්‍ෂර, වර්ණ, වෘෂන් (පුරුෂ ලිංග), වචන, විභක්ති යන පද බ්‍රාහ්මණ ග්‍රන්ථවල භාවිත වී තිබේ. සමහර තැන්වල ඒ පිළිබඳ විස්තර ද සැපයේ. ආරණ්‍යක හා උපනිෂද් ග්‍රන්ථ සමහරක ශබ්ද ශාස්ත්‍රයේ ඇති විශේෂ පද සඳහන් කෙරේ. ඡාන්දෝග්‍ය උපනිෂදයේ

---

[3] චිත්‍රා ජයසේකර සහ තවත් අය, වාග් විද්‍යාත්මක ලිපි - ආනන්ද ජයසේකර, පියසිරි ප්‍රින්ටර්ස්, නුගේගොඩ, 1996, පිටු 88-89

ස්වර, ස්පර්ශ හා ඌෂ්මන් යන නම් යොදා අක්ෂර ප්‍රභේද ශාස්ත්‍රීය ලෙස බෙදා දක්වා තිබීමෙන් ඒ බව පැහැදිලි වේ.[4]

ඉහත කී ශික්ෂා ගුරුකුලයට අයත් ආචාර්වරුන්ගේ ඊළඟ කාර්යය වූයේ සංහිතා පාඨයේ පද වෙන් කිරීම යි. වේද සංහිතා ඉගෙනීමේ දී ඊට ඇතුළත් සෑම වචනයක් ම පැහැදිලිව ශබ්ද කිරීමත් නියම අර්ථය අවබෝධ කරගැනීමත් අවශ්‍ය ම වූ නිසා සූක්තවල වචන වෙන් කිරීම පළමුව කළයුතු විය. එය පාදපාඨ නමින් වෛදික සාහිත්‍යයේ සඳහන් වේ. පදපාඨය ශික්ෂා වේදාංගය පිළිබඳ පුහුණුවක් ලත් උගතුන්ගේ නිර්මාණයක් සේ සැලකෙයි.[5] වේද මන්ත්‍රයන් සංහිතාවන්හි එන ආකාරයට ම නිදොස්ව උච්චාරණය කිරීම මෙම කෘතිවලින් ද අපේක්ෂා කළ බැවින් ඒ සඳහා සංහිතා පාඨය පදයෙන් පදය වෙන්කොට දැක්වීමට පටන් ගත් බව පෙනේ. පද පාඨය බවට පත්වූයේ මෙම ක්‍රියාවලිය යි. පද පාඨය මන්ත්‍රයන්ගේ උච්චාරණයට මෙන්ම අර්ථයට ද වැදගත් තැනක් දී සකස් කරන ලද්දක් හෙයින් වේදාර්ථ ව්‍යාඛ්‍යානයෙහි ලා ගත් මුල් පියවරක් වශයෙන් ද ඉතා වැදගත් වේ. එනිසා එය භාෂ්‍ය ස්වරූපයට ද වැටෙයි. එහි සංහිතා පාඨය වචනයක් පාසා වෙන්කොට විසන්ධි කොට දැක්වෙන අතර සමාස පද බොහොමයක් ද ඇතැම් ව්‍යුත්පන්න ශබ්ද හා විභක්ති රූප ද විග්‍රහකොට දැක්වේ. මෙම කාර්යය කිරීමේ ගෞරවය හිමිවන්නේ ශාකල්‍යට ය. මන්ත්‍රවල පද ව්‍යාකරණානුකූලව බෙදා සමාස විග්‍රහ කොට දැක්වීම ඔහුගේ කාර්යය විය. පහත දැක්වෙන්නේ ඍග් වේදයේ පළමු මන්ත්‍රයට කරන ලද පද පාඨය යි.[6]

| ඍග් සංහිතා පාඨය | පද පාඨය |
|---|---|
| අග්නිමීළෙ පුරොහිතං | අග්නිම් ඊළේ පුරඃ හිතම් |
| යඥස්‍ය දේවමෘත්විජම් | යඥස්‍ය දෙවම් ඍත්විජම් |
| හොතාරං රත්නධාතමම් | හොතාරම් රත්න 'ධාතතම් |
| අග්නිඃ පූර්වේභිර්ඍෂිභිර් | අග්නිඃ පූවේඃ ඍෂි භිඃ |
| ඊඩ්‍යො නූතනෛරුත | ඊඩ්‍යඃ නූතනෛඃ උත |
| සදෙවාංඑහ වක්ෂති | සඃ දේවාන් ආ ඉහ වක්ෂති |
| අග්නිනා රයිමශ්නවත් | අග්නිනා රයිම් අශ්නවත් |
| පොෂමෙව දිවෙදිවෙ | පෝෂම් එව දිවෙ' දිවෙ |
| යශසං වීරවත්තමම් | යශසම් වීරවත් 'තමම් |

මෙම උදාහරණය අනුව සන්ධි විග්‍රහ කිරීම පද පාඨයේ එක් ලක්ෂණයක් බව පෙන්. අග්නිම්+ඊළේ යනු සන්ධි විග්‍රහය යි. එසේම රත්නධාතමම් හා වීරවත්තමම් යන සමාස විග්‍රහ කිරීම තුළින් පද පාඨයෙහි සමාස විග්‍රහ කිරීමේ ලක්ෂණ හඳුනාගත හැකිය. උක්ත සමාස පද දෙක විග්‍රහ කර ඇති ආකාරය අනුව පදපාඨයෙහි සමාස විග්‍රහයේ මූලික ලක්ෂණ හඳුනාගත හැකිය. එම පද දෙකෙහි ම අග ඇති තම යන ප්‍රත්‍යය දෙවිධියකින් වෙන්කරන්නට පදපාඨය යොමු වී ඇති බව ඒවා සමීප ව

[4] ජයදේව තිලකසිරි, වෛදික සාහිත්‍යය, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1967, පි. 136
[5] ජිනසෝම වීරසූරිය, පි. 10
[6] එම, පි. 13

නිරීක්ෂණය කිරීමෙන් පෙනෙයි. රත්නධාතමම් යන පදය රත්න ධාතතම් ලෙස ද වීරවත්තමම් යන පදය වීරවත් තමම් ලෙස ද වෙන් වී ඇත. සමාසයක් පද දෙකකට මිස ඊට වැඩි ගණනකට බෙදීමේ ක්‍රමයක් මේ කාලයේ නොතිබීම ඊට හේතුව යි.

පදපාඨයෙහි නාම වරනැඟීම සම්බන්ධ අදහස් තරමක් සංකීර්ණ ය. භිස් භ්‍යස් ආදි නාම පද ප්‍රත්‍ය වෙන් වූ පද සේ පදපාඨය පිළිගෙන ඇති බවට සාධක ඉහත නිදසුනෙහි ඇත. එයින් පෙනෙන්නේ ආරම්භයේ දී ඒවා අර්ථ සහිත වූ වෙන්ව යෙදිය හැකි පද වූ බව යි. බාහිර සන්ධි විෂයෙහි ඇති වන විකාර, මේවා වෙන ම පද ලෙස භාවිත වූ බව වැඩිදුරටත් ස්ඵුට කරයි. නිදසුන් ලෙස සලකතොත් පූර්ව පදයේ අන්තය විකෘත වන තැන්වල දී නාම ප්‍රත්‍යය වෙන් නොකිරීමත් විකෘත වන තැන්හි දී වෙන් කිරීමත් පදපාඨය ක්‍රමය යි. ඉහත දැක්වූ නිදසුනෙහි පූර්වෙභිඃ යන තැන භිඃ යන්න වෙන් නොකළ ආකාරයත් ඍෂිභිඃ යන්නෙහි භිඃ යනු වෙන ම පදයක් සේ ගෙන වෙන් කර ඇති ආකාරයත් ඊට සාධක සපය යි.

මෙලෙස පදපාඨකරුවන් තුළ සතුව තිබූ ව්‍යාකරණානුකූල පද විග්‍රහය පිළිබඳ අවබෝධය ඉන්දු ආර්ය ව්‍යාකරණයේ ප්‍රාරම්භය සනිටුහන් කරයි. මැක්ඩොනල්ගේ අදහස් වී ඇත්තේ ව්‍යාකරණ යන පදයෙන් මුලින් අදහස් වන්නට ඇත්තේ පදයක කොටස් විග්‍රහ කිරීම නොව මෙම පදවිශේෂ වෙන්කොට දැක්වීම බව යි. සත්‍ය ලෙස ම මෙය වාක්‍ය විග්‍රහයකි. වේද මන්ත්‍රාගත වාක්‍යයන්හි පද විශේෂ සන්ධි නාම සමාස ආදි එළඹුම්වලින් වෙන් කිරීමයි එහි දී සිදුව ඇත්තේ. ඉහත දැක්වූ නිදසුන්වලින් එක් එළඹුමක වුවද විවිධතා ඇති බව පැහැදිලි විය. එයින් පෙනෙන්නේ පදපාඨකරුවන්ගේ වාක්‍ය විග්‍රහ ඥානයේ මහත්වය යි. පද විශේෂ වෙන් කිරීමේ දී අනුගමනය කළ නීති පදපාඨයෙහි නො දැක්වෙතත් පදපාඨකයන් තුළ එම දැනුම තිබූ බවට සැකයක් නැත.